# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2064/53 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

194 වන වගන්තිය යටතේ වන නියෝග

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ, පනතේ පරමාර්ථ සඳහා සාදනු ලබන නියෝග. මෙම නියෝග 2018 අප්‍රේල් මස 01 වනදා සිට ක්‍රියාත්මක වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 මාර්තු මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

නියෝග

*අන්තර්කාලීන විධිවිධාන*

01. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ දක්වා ඇත්නම් හෝ මෙම රෙගුලාසිවල ඉක්බිතිව දැක්වෙන ප්‍රතිපාදන මගින් නියෝග කර ඇත්නම් මිස 2018 අප්‍රේල් මස 01 වන දිනෙන් හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු සම්බන්ධයෙන් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අදාළ නොවිය යුතු ය.

02. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16ඇ, 16ඈ, 16ඉ, 17, 17අ, 18, 20, 24අ වගන්තිවල ප්‍රතිපාදන යටතේ පුද්ගලයෙකුගේ ලාභ සහ ආදායම සම්පූර්ණයෙන්ම හෝ කොටසක් එම ප්‍රතිපාදනවල නිශ්චිතව දක්වා ඇති කාල සීමාවක් සඳහා නිදහස් කර ඇත්නම් සහ 2018 මාර්තු 31 වන විට ඒ කාල සීමාවෙන් කොටසක් නොගෙවී ඉතිරිව ඇති අවස්ථාවක එම කොටස ඒ විධිවිධාන අඛණ්ඩව පවතින්නාක් මෙන් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවා සේ අඛණ්ඩව පැවතිය යුතු ය.

03. (අ) යම් ව්‍යවසායක් 2018 අප්‍රේල් මස 01 දිනට පෙර 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇත්නම් ; සහ

(ආ) එම ගිවිසුම තුළින්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආදායම් බද්දෙන් නිදහස් කිරීමට හෝ අඩුකළ අනුප්‍රමාණ වලට බදු කිරීමට, හෝ ආදායම් බදු බැදියාව ආගනණය කිරීමේ පදනමට අදාළව ප්‍රතිපාදන සලසයි නම්,

එම ව්‍යවසායේ ලාභ සහ ආදායම් තවදුරටත් එම ගිවිසුම යටතේ දක්වා ඇති ආකාරයට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් නිදහස් කිරීම හෝ එම ගිවිසුමේ පරිදි ගණනය කරන ලද සහ එහි සඳහන් අනුප්‍රමාණයට බද්දට යටත් කිරීම සිදුකළ යුතු ය.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. යම් පුද්ගලයෙකුගේ ලාභ සහ ආදායම් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 59 ඇ, 59එ, 59ඒ, 59ඔ, 59ඕ, 59ක වගන්තිවල ප්‍රතිපාදන යටතේ යම් නිශ්චිත කාල සීමාවකට සහනදායී අනුපාතය යටතේ බදු ගෙවීමට හිමිකම් ලබයි නම් සහ 2018 මාර්තු 31 දින වනවිට එම කාල සීමාවෙන් කොටසක් ඉතිරිව ඇත්නම් එම නිශ්චිත කාලසීමාව අඛණ්ඩව පැවතිය යුතු ය.

05. යම් තක්සේරු, වර්ෂයක් සඳහා යම් තැනැත්තෙකුගේ තක්සේරු කළහැකි ආදායම ගණන් බැලීමේදී යම් අලාභයක් අඩුකිරීම සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ යම් විධානයක් මගින් විධිවිධාන සලසා ඇති විටක සහ 2018 මාර්තු 31 වන දින එම අලාභය ඉතිරිව පවතින යම් ශේෂයක් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ, 2018 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා උද්ගත වූ අලාභයක් ලෙස සළකනු ලැබිය යුතු අතර, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත් විධිවිධාන අනුව අඩුකළ හැකිවිය යුතු ය.

06. යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තෙකුගේ බදු අයකල හැකි ආදායම ගණන් බැලීමේදී යම් දීමනාවක් අඩුකිරීම සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 වන වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති සහ 2018 මාර්තු 31 වන දිනදී ඒ දීමනාවේ යම් ශේෂයක් ඉතිරිව තිබෙන අවස්ථාවක ඒ ශේෂය එම අඩුකිරීම කලහැකි කරවන විධිවිධානයේ නිශ්චිතව සඳහන් යම් කොන්දේසි වලට යටත්ව ඒ විධිවිධානය අඛණ්ඩව අදාළව පවතින්නාක් මෙන් 2018 අප්‍රේල් 01 වන දින හෝ එදිනට පසු ආරම්භව වන යම් තක්සේරු වර්ෂයක් තුළ, ඒ තැනැත්තාගේ බදු අයකළ හැකි ආදායමෙන් අඩුකරනු ලැබිය හැකිවිය යුතු ය.

07. (අ) 2006 අප්‍රේල් මස 01 වන දිනට ප්‍රථම අත්පත් කරගත් ප්‍රාග්ධන වත්කමක්, 2006 අප්‍රේල් මස 01 වන දිනට ප්‍රථම ඉදකරන ලද හෝ අත්පත් කර ගන්නා ලද සුදුසුකම් ලබන ගොඩනැගිල්ලක් හෝ,

(ආ) 2006 අප්‍රේල් මස 01 වන දිනට පසු නමුත් 2018 අප්‍රේල් මස 01 වන දිනට ප්‍රථම මිලදීගත් ප්‍රාග්ධන වත්කමක්, 2006 අප්‍රේල් මස 01 වන දිනට පසු නමුත් 2018 අප්‍රේල් මස 01 දිනට ප්‍රථම ඉදිකරන ලද හෝ අත්පත් කර ගන්නා ලද සුදුසුකම් ලබන ගොඩනැගිල්ලක්

වෙනුවෙන් ක්ෂය වීම සඳහා දීමනාව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අදාළ විධිවිධාන අනුව, ගණනය කිරීම සහ අඩු කිරීම කළ යුතු ය.

08. 2018 අප්‍රේල් 1 වන දිනට පෙර එළඹී යම් මූල්‍ය කල්බදු ගිවිසුමකට අදාල යම්, ලාභ, අලාභ ලැබීමක් හෝ ගෙවීමක්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අදාල විධිවිධාන අනුව ආගණනය කළ යුතු ය.

09. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ඕනෑම විධිවිධානයක් අනුව අමාත්‍යවරයා හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කොට ඇති පහත සඳහන් අස්ථිත්ව හෝ ක්‍රියාකාරකම් මෙම පනතේ අදාළ විධිවිධාන යටතේ අනුමත කොට ඇති ලෙස උපකල්පනය කළ යුතු ය.

| අස්ථිත්ව/ක්‍රියාකාරකම් වර්ගය | අනුමත කළේ |
|---|---|
| අර්ථසාධක හෝ ඉතුරුම් සමිති | අමාත්‍යවරයා |
| මානුෂීය ගනයට අයත් ක්‍රියාකාරකම් | |
| අසරණ හෝ රෝගී පුද්ගලයින් සඳහා ආයතන | |
| අර්ථසාධක අරමුදල | අමාත්‍යවරයා හෝ කොමසාරිස් ජනරාල් |
| ඉතුරුම් හෝ විශ්‍රාම අරමුදල | |
| පාරිතෝෂික අරමුදල | |
| ඕනෑම ගණකාධිකාරීවරයෙකු හෝ ඕනෑම පුද්ගලයෙකු (බලයලත් නියෝජිතයා සහ අර්ථ නිරූපණය සඳහා) | කොමසාරිස් ජනරාල් |

10. 2006 අංක 10 දරන දේශීය ආදායම පනතේ 138 (2) වගන්තිය අනුව ඉදිරියට ගෙන ආ මතිමාත්‍ර බදු බැර 2018/2019 තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන අනුක්‍රමික වසර 3 ක් තුළ ආදායම් බදු සඳහා හිලව් කිරීම පිණිස ඉදිරියට ගෙන යා හැකිය.

11. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව යම් සමාගමක් එය වෙනත් සමාගමකින් ලැබුණු, 2018 අප්‍රේල් මස 01 වන දිනට පෙර බදු අඩුකරනු ලැබූ ලාභාංශ වලින් කොටස් හිමිකරුවන්ට, 2019 අප්‍රේල් මස 01 දිනට පෙර ගෙවනු ලබන යම් ලාභාංශයක් සම්බන්ධයෙන් වනවිට, එම ලාභාංශ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ බද්දට යටත් නොවිය යුතුය.

12. 2018 අප්‍රේල් මස 01 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව යම් තැනැත්තෙකුගේ වෙළඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් ලැබෙන මුදලේ ප්‍රතිශතයක් ලෙස එම තැනැත්තාගේ ලාභය නිශ්චය කරන ලැබූ නිර්වාසික තැනැත්තෙකු සම්බන්ධයෙන් වනවිට, ලැබෙන මුදලේ එම ප්‍රතිශතය 2018 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ද අඛණ්ඩව අදාළ විය යුතු ය.

13. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 28 වගන්තිය යටතේ විධානයක් නිකුත්කර ඇති විට, ඒ විධානය අඛණ්ඩව බලපැවැත්විය යුතු ය.

04 - 839

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.